*සැ. යු.*- 2017.11.02 දින පළ වූ අංක 2,044 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,045 - 2017 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා - 2017.11.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2200 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 2203 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) භාර (සංශෝධන) පනත් කෙටුම්පත 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 නොවැම්බර් මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2199- B 81225 — 5,403 (2017/11)
F 1 -

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (වයඹ පළාත)

### රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පන්තියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත් සළකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට මාවතගම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2017.12.27 වැනි දින පෙ.ව. 10.00 ට මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(*අ*) දිස්ත්‍රික්කය : කුරුණෑගල
(*ආ*) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : මාවතගම
(*ඇ*) ග්‍රාම නිලධාරි වසම : 677 මාවතගම සහ 682 වැලිකුඹුර
(*ඈ*) ඉඩම පිහිටි ගම : මාවතගම සහ වැලිකුඹුර
(*ඉ*) ඉඩමේ නම : ඩෙනවර් වත්ත
(*ඊ*) ඉඩමේ විස්තරය : ගම් පුළුල් කිරීම යටතේ බෙදා දීමට අත්පත් කරගත් ඉඩම
(*උ*) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : (වාරිමාර්ග පහසුකම් සළසන ලද හා/හෝ වාරි මාර්ග පහසුකම් සලසා නොමැති) වාරි මාර්ග පහසුකම් සළසා නොමැති ගොඩ ඉඩම
(*ඌ*) අන්සතු කරනු ලබන ඒකකය : නේවාසික කටයුතු පර්චස් 15 සිට පර්චස් 20 දක්වා

02. මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පන්තිවලට අයත් ලැබෙන ඉල්ලුම්පත්‍ර සළකා බලනු ලැබේ.

නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන ඉ.කො. 157 ලේඛනයේ ලියාපදිංචි වූ රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබා ගැනීමට සුදුසු ආදායම් කාණ්ඩයට අයත් අය.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2017.12.11 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, මාවතගම වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

04. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2017.12.27 දින පෙ.ව. 10.00 සිට මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ *නැතහොත්* තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

06. තෝරා ගනු ලබන සෑම අයදුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ අවසර පත්‍රයක් ලැබෙන අතර එය, එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

06. අවසර පත්‍රයක් ලබාගැනීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රු. 150 බැගින් ගණන් බලන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිලට එය හිලව් කරනු ලැබේ.

07. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගේ හා ඔවුන්ගේ නම ඉදිරියෙන් ඇති ස්ථානවලින් ද ලබා ගත හැක.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාවතගම
ජනපද නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාවතගම
ග්‍රාම නිලධාරී - අංක 677 - මාවතගම, අංක 682 - වැලිකුඹුර

ඩී. එම්. කේ. සී. දිසානායක,
පළාත් ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2017 ඔක්තෝබර් මස 16 වැනි දින දී ය.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික කටයුතු සඳහා ඉඩම් ලබා දීමට මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 677 මාවතගම, 682 වැලිකුඹුර යන වසම්වල ඉඩම් බෙදා දීමට තෝරා ගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :.................................................................................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................................................

03. (i) ලිපිනය :.................................................................................................................................................

(ii) ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :..................................................................................................

(iii) ග්‍රාම නිලධාරී කොට්ඨාසය :...........................................................................................................................

04. ගෘහ මූලික අංකය :..........................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :.............................................................

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) :...........................................................

07. උපන් දිනය :.......................................................................

08. විවාහක/අවිවාහක බව :....................................................

09. රැකියාව :.........................................................................................................................................................

10. රැකියාව කරන ස්ථානය :.........................................................................................................................

11. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |
| 05. | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :.....................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :........................................................................................................
(තමාගේ ද?/බද්දට ද?/අනවසරයෙන් ද? යන වග)

15. නිවස පිහිටි ස්ථානය :......................................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :.........................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන පාසලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03. | | | |
| 04. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :..........................................................................................................
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :.........................................................................
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :..........................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරි කළ මුදල |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

20. ඉඩම්ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 1 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

..........................................,
ග්‍රාම නිලධාරිගේ අත්සන.

නම :—————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

අනු අත්සන් කරමි.

..................................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

*දිවුරුම් ප්‍රකාශය*

.................................. දිස්ත්‍රික්කයේ .................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ........................... ග්‍රාම නිලධාරි වසමේ ............................. පදිංචි ......................................... වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ට ද, සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර ............. රූඩ්................ පර්චස් ................ ක් වූ ඉඩම පවරා ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත් වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

.........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ දී අත්සන් තැබූ බවත් සහතික කරමි.

....................................................,
සමාදාන විනිශ්චයකාරතැන.

11-437

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව**

පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත

**පුහුණු පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2018**

බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන දැව තාක්ෂණ, ලුහු ඉංජිනේරු, විද්‍යුත් තාක්ෂණ යන පුහුණු පාඨමාලා (සිංහල මාධ්‍ය) සඳහා 2018 වර්ෂයට ආධුනිකයින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන අතර ඒ සඳහා උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | පාඨමාලා | NVQ මට්ටම | කාලය | ගාස්තු | අධ්‍යාපන සුදුසුකම් | |
|---|---|---|---|---|---|---|
| | | | | | පූර්ණකාලීන | කෙටිකාලීන |
| 01 | **ද්‍රව තාක්ෂණ නිෂ්පාදන පුහුණු පාඨමාලා :**<br>• වඩු සටහන් ඇඳීම<br>• වඩු අත් ආයුධ/යන්ත්‍ර හඳුනා ගැනීම<br>• ලී වැඩ තාක්ෂණය<br>• වෘත්තීය ගණිතය | - | මාස 12 | නොමිලේ | අ.පො.ස. (සා. පෙළ) පෙනී සිටි හෝ 8 ශ්‍රේණිය සමත් ගැහැණු/පිරිමි දෙපක්ෂයටම | වයස් භේදයක් නොමැත. |
| 02 | **ලුහු ඉංජිනේරු තාක්ෂණ පුහුණු පාඨමාලා :**<br>• වෙල්ඩින් ශිල්පය<br>• විශේෂ ලියවන පට්ටල් වැඩ<br>• වායු හා විදුලි පෑස්සුම් වැඩ<br>• කම්මල් වැඩ<br>• ජ්‍යාමිතිය හා යාන්ත්‍රික ඇඳීම<br>• විෂයානුබද්ධ ඉංග්‍රීසි | NVQ 03 | මාස 12 | නොමිලේ | අ.පො.ස. (සා. පෙළ) පෙනී සිටි හෝ 8 ශ්‍රේණිය සමත් පිරිමි ළමුන් | - |
| 03 | **විද්‍යුත් තාක්ෂණ පුහුණු පාඨමාලා :**<br>• මූලික විද්‍යුත් තාක්ෂණය<br>• සරල ධාරා සහ ප්‍රත්‍යාවර්ථ ධාරා<br>• ගුවන් විදුලි සහ රූපවාහිනී<br>• විෂයානුබද්ධ ඉංග්‍රීසි | - | මාස 06 | නොමිලේ | අ.පො.ස. (උ. පෙළ) පෙනී සිටි හෝ අ.පො.ස. (සා.පෙළ) සමත් ගැහැණු/පිරිමි දෙපක්ෂයටම | - |

- ➢ පුහුණු පාඨමාලා සාර්ථකව නිමකරන ලද පුහුණුලාභීන් සඳහා වෘත්තීය පුහුණුවට සම්බන්ධ රජයේ පිළිගත් සහතිකයක් ලබා දෙනු ලැබේ.

- ➢ පූර්ණකාලීන පුහුණු පාඨමාලා සඳහා පුහුණු කාලය තුළ රු. 250.00 ක දෛනික පැමිණීමේ දීමනාවක් ගෙවනු ලැබේ.

*පාඨමාලා සඳහා අයදුම් කිරීම :*

- ➢ ඔබ විසින්ම සකස් කර ගත් අයදුම්පතක් නම, ලිපිනය, දුරකථන අංකය, කැමති පාඨමාලාව, අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව 2017.12.12 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

- ➢ අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර ඔබ විසින් අයදුම් කරන පාඨමාලාව සඳහන් කළ යුතු ය.

- ➢ අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :*

අධ්‍යක්ෂ,
බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව,
අංක 787/3, නවසිටි ගොඩනැගිල්ල,
කඩුවෙල පාර, මාලඹේ.

011-3049208
011-3106074

11-640